GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

GMOA/MOH/2013/0015
05/08/2013

ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා
සෞඛ්‍ය අමාත්‍යතුමා,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
කොළඹ 10.

ගරු ඇමතිතුමණි,

**ආනයනික කිරි පිටි වල විෂ අඩංගුව තිබීම නිසා උද්ගතව තිබෙන ගැටලුකාරී තත්ත්වය.**

විද්‍යා හා තාක්ෂණික අමාත්‍යාංශය යටතේ ඇති ITI ආයතනය මඟින් පසුගියදා ශ්‍රී ලංකාවේ භාවිතා වන කිරි පිටි පිළිබඳ විශේෂ වාර්තාවක් නිකුත් කරන ලදී. මේ සමග අමුණා ඇති එම වාර්තාවට අනුව ආනයනික කිරි පිටි වර්ග 04 ක DCD නැමැති විෂ රසායනික ද්‍රව්‍ය අඩංගු බවත්, දේශීය කිරි පිටි වල එම විෂ රසායනය අඩංගු නැති බවත් තහවුරු වී ඇත.

මීට අමතරව ආනයනික කිරි පිටි වල Botulinum විෂ අන්තර්ගත බව නවසීලන්ත රජය ලෝක සෞඛ්‍ය සංවිධානය මඟින් දැනුම් දී ඇත. චීනය ආනයනික කිරි පිටි දැනටමත් තහනම් කර ඇත. (මේ පිළිබඳ සාක්ෂි මෙයට අමුණා ඇත)

තත්ත්වය මෙතරම් භයානක වුවද, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමහරක් ඉහල නිලධාරීන් ස්වකීය ශ්‍රී ලංකා රජයේ වාර්තාව බැහැර කර තායිලන්ත වාර්තාවක් පදනම් කර ගනිමින් ආනයනික කිරි පිටි සුරක්ෂිත බවට මාධ්‍ය වලට ප්‍රකාශ ලබා දේ.

ආහාර පනත සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට පැවරී ඇති නීතිමය බල තල අනුව ආහාර සුරක්ෂිත භාවය සඳහා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ගත යුතු කිසිදු පියවරක් අනුගමනය කරන අයුරු දක්නට නැත. මෙය භයානක තත්ත්වයක් බව ඔබ තුමාට විශේෂයෙන් කිව යුතු නැත.

මෙම පසු බිම යටතේ වග කිව යුතු වෘත්තීය සංගමයක් වශයෙන් අප පහත යෝජනා ඉදිරිපත් කරමු.

1. ඉහත සඳහන් කල ITI වාර්තාව නොසලකා හරින නිලධාරීන් පිළිබඳ වහාම විමර්ශණයක් ආරම්භ කිරීම.
2. ඉහත ගැටලු නිරාකරණය කර ගන්නා තෙක් අවම වශයෙන් ආයනික ළදරු කිරි පිටි වර්ග වත් තාවකාලිකව තහනම් කිරීම.
3. මේ පිළිබඳ ඔබතුමා සමඟ සාකච්ඡා කිරීමට හැකි ඉක්මනින් අවස්ථාවක් ලබා දීම.

මේ පිළිබඳව ඔබ තුමාගේ ඉක්මන් අවධානය යොමුවනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

ස්තූතියි

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්.

පිටපත් :
ගරු විද්‍යා හා තාක්ෂණ අමාත්‍ය චම්පික රණවක මැතිතුමා
ලේකම් - සෞඛ්‍ය අමාත්‍යාංශය
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල්
රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය සියලුම ශාඛා
ශ්‍රී ලංකාවේ ඇති සියලුම වෛද්‍ය සංගම්